**<u>සංචාරක බංගලාවන් වෙන් කර ගන්නා ආකාරය ( සංචාරක බංගලාව A හා B )</u>**

- මෙම සංචාරක බංගලාව වෙන් කිරීමේ වරප්‍රසාදය හිමිව ඇත්තේ **රාජ්‍ය අංශයේ නිලධාරීන්ට, අර්ධ රාජ්‍ය නිලධාරීන්ට හා රජයේ විශ්‍රාමික නිලධාරීන්ට පමණක්** බව කරුණාවෙන් සලකන්න.
- එක් වතාවක් සඳහා සංචාරක බංගලාව වෙන්කර ගැනිමේ කාලය උපරිම දින 03 කි. (රාජකාරි අවශ්‍යතාවයක් බව සනාථ කරන්නේ නම් උපරිම දින ගණන 06 කි.)
- සංචාරක බංගලාව වෙන් කර ගැනීම සඳහා මේ සමග දක්වා ඇති අයදුම්පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කර ආයතන ප්‍රධානී හෝ තම විශ්‍රාම වැටුප ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ සහිතව මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත පැමිණ හෝ පහත දුරකථන අංකය ඇමතීමෙන් සිදුකර ගත හැක.

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයට අදාළ පහසුකම් ලබා ගත හැකිදැයි දුරකථනයෙන් විමසා තහවුරු කර ගැනීමෙන් අනතුරුව පහත ගිණුමට මුදල් බැර කළ හැකිය. ඉන් අනතුරුව සම්පූර්ණ කරන ලද අයදුම්පත හා බැංකු රිසිට් පත 076-6701335 දරණ WhatsApp අංකය වෙත හෝ 081 - 2233186 අංකයට ෆැක්ස් මඟින් හෝ development.kds@gmail.com වෙත ඊමේල් මඟින් යොමු කළ හැක. (**දුරකථනයෙන් විමසා තහවුරු කර ගැනීමෙන් තොරව මුදල් ගෙවීමෙන් වළකින්න.)**

- **ලංකා බැංකුව - මහනුවර ශාඛාව - ගිණුම් අංකය : 0007041757**
- **ගිණුම් හිමියාගේ නම : දිස්ත්‍රික් ලේකම්, මහනුවර**

- ඔබට සංචාරක බංගලාව වෙන් කර ගැනීමට හැකි වන්නේ ඔබ අයදුම්පත ඉදිරිපත් කරන දින සිට දින 30ක් ඉදිරියෙන් ඇති (මාසයක් ඉදිරියෙන්) දිනක් සඳහා වේ.

- **සංචාරක බංගලාව වෙන් කර ගැනිම සඳහා විමසීම්**
  - ❖ **දුරකතන අංක: 081-2222233** (දිස්ත්‍රික් ලේකම් කාර්යාලය-සංවර්ධන අංශය)
  - ❖ 076-6701335 දරණ **WhatsApp** අංකය මඟින්ද සම්බන්ධ විය හැක

**<u>සංචාරක බංගලාව භාවිතයේදී පිළිපැදිය යුතු කොන්දේසි</u>**

- අයදුම්කරු සංචාරක නිවාසයේ අනිවාර්යයෙන් නවාතැන් ගැනීම සිදු කළ යුතු අතර සංචාරක නිවාසයේ නවාතැන් ගැනීමේ දී ජාතික හැඳුනුම්පත, රාජකාරි හැඳුනුම්පත/විශ්‍රාමික හැඳුනුම්පත, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් අනුමත කරන ලද අයදුම්පතේ පිටපතක් හා මුදල් ගෙවන ලද කුවිතාන්සියේ මුල් පිටපත බංගලා භාරකරු වෙත අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පතෙහි සඳහන් නොමැති පුද්ගලයන් සඳහා නවාතැන් පහසුකම් නොසපයන ලෙස සංචාරක නිවාසයේ භාරකරු දැනුවත් කර ඇති බැවින් අයදුම්පතෙහි නම සඳහන්ව නොමැති කිසිදු පුද්ගලයෙකු සංචාරක නිවාසයේ නවාතැන් ගැනීමට රැගෙන නොයා යුතුය.

**සැ.යු. - අයදුම්කරු නොමැතිව නවාතැන් ගැනීම සඳහා පැමිණෙන පිරිස ආපසු හරවා යැවීමට සිදු වන බව කරුණාවෙන් සලකන්න.**

- **වෙන් කර ගත් දින රාත්‍රී 9.00 ට පෙර සංචාරක බංගලාව වෙත පැමිණීම අනිවාර්ය වන අතර, රාත්‍රී 9.00** පසුවී පැමිණෙන නවාතැන් කරුවන් ආපසු හරවා යැවීමට සිදු වන බව කාරුණිකව දන්වමි.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රාජකාරි අවශ්‍යතාවයකදී කෙටි දැනුම්දීමකින් මෙම වෙන් කිරීම අවලංගු කිරීමේ පදනම මත සංචාරක බංගලාව වෙන් කරනු ලැබේ. එවැනි අවස්ථාවක දී ගෙවන ලද මුදල ආපසු ගෙවනු ලැබේ.
- අයදුම්කරුගේ හේතුවක් මත වෙන් කරගත් සංචාරක බංගලාව භාවිත කිරීමට නොහැකි වීම මත ඒ වෙනුවෙන් ගෙවන ලද මුදල් ආපසු ගෙවීමක් හෝ වෙනත් දිනයක් ලබා දීම සිදු කරනු නොලැබේ.

- වෙන් කර ගත් අයදුම්පත්‍රය කිසිදු හේතුවක් නිසා හෝ වෙනත් අයදුම්කරුවෙකු වෙත පැවරීමට ඉඩ දෙනු නොලැබේ.

- නවාතැන් ගන්නා අයගේ අනන්‍යතාවය පිළිබඳව අයදුම්කරු සෑහීමකට පත්විය යුතු අතර, නවාතැන් ගන්නා කාල වකවානුව තුළදී ඒ සම්බන්ධයෙන් වන සියලු වගකීම් අයදුම්කරු විසින් දැරිය යුතුය.

- ඇඳ ඇතිරිලි, කොට්ට උර හා සනීපාරක්ෂක පහසුකම් සඳහා සංචාරක නිවාස භාරකරු වෙත ගෙවීම් කළ යුතුය.

- සංචාරක නිවාසයේ ගත කරන කාලය තුළ එහි **අභ්‍යන්තර හෝ බාහිර කිසිවකට අලාභ හානි නොකළ යුතුයි. එවැනි අලාභ හානියක් සිදු වුවහොත් එය යථා තත්ත්වයට පත්කිරීමට වන සියලුම වියදම් ඔබ විසින් දැරිය යුතුය.**

- මෙම බංගලාවේ **උත්සව හෝ සම්භාෂණ පැවැත්වීම හා මත්පැන්, දුම්වැටි භාවිතා කිරීම සම්පූර්ණයෙන්ම තහනම් වේ.**

- ඔබ සංචාරක නිවාසයේ ගත කරන කාලය තුළ කරන ලද ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔබට විරුද්ධව යම් පැමිණිල්ලක් ලැබුණහොත් ඉදිරියේදී මෙම සංචාරක නිවාසය වෙන් කිරීම පිළිබඳ ඔබේ හා පවුලේ අයගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

- "B" සංචාරක බංගලාව, කාමර වෙන් වෙන් වශයෙන් ලබා දෙන බැවින් **නිවසේ ඇති නාන කාමරය පොදුවේ භාවිතා** කළ යුතු බව කාරුණිකව දන්වමි.

- මෙම සංචාරක බංගලාවන් සම්බන්ධයෙන් දැනුවත් කරලීම සඳහා A හා B ලෙස වර්ගීකරණය කර ඇති බවත්, නවාතැන් සපයා ගැනිමට පැමිණෙන නිලධාරින්ගේ පහසුව සඳහා පහත වගුව ඉදිරිපත් කරන බවත් කාරුණිකව දන්වමි.

| සංචාරක බංගලාව A ( අංක 12/15A/3/1) | සංචාරක බංගලාව B (අංක 12/15/3/1) |
|---|---|
| ❖ **නිවසක් ලෙස** භාවිතා කළ හැකි විම | ❖ **කාමර වශයෙන් වෙන් වෙන්ව** භාවිතා කළ හැකි වීම ( නිවසේ ඇති නාන කාමරය පොදුවේ භාවිතා කළ යුතු වීම) |
| ❖ **Queen Size ඇඳ බැගින් ඇති කාමර 03** සමඟ Living Area, Kitchen හා පොදු වැසිකිලියක් සහිත නාන කාමරයක් ඇත (කාමර 02 ක් A/C හා කාමර 01 ක් Non A/C) | ❖ **Double හා single ඇඳ බැගින් ඇති කාමර 03** සමඟ Living Area, Kitchen හා පොදු වැසිකිලියක් සහිත නාන කාමරයක් ඇත (කාමර 02 ක් A/C හා කාමර 01 ක් Non A/C) |
| ❖ භාවිතා කළ හැකි උපකරණ ලෙස ශීතකරණය (Refrigerator) හා TV | ❖ ශීතකරණය පමණක් පවති |
| ❖ **වැඩිහිටියන් 06 දෙනෙකු හා අවු.05ට අඩු දරුවන් 03 දෙනෙකු හට** නවාතැන් සපයා ගත හැක | ❖ **එක් කාමරයක 03 දෙනෙකු හට නවාතැන් සපයා ගත හැකි අතර, කාමර 03 සඳහාම වැඩිහිටියන් 09 දෙනෙකු හට නවාතැන්** සපයා ගත හැක (**අවු.05 ට වැඩි දරුවෙකුද පුද්ගලයෙකු සේ** සලකමි. |
| ❖ ආහාර පිසීම සඳහා භාණ්ඩ හා උපකරණ පවති (ගෑස් සිලින්ඩරය සමඟ ) | ❖ ආහාර පිසීම සඳහා භාණ්ඩ හා උපකරණ නොමැත. |
| ❖ එක් දිනකට අය කිරිම **රුපියල් 5,500.00** | ❖ එක් දිනකට අය කිරිම- **A/C කාමරයක් රුපියල් 2,000.00 හා Non A/C) කාමරයක් රුපියල් 1,500.00 ක් වේ.** |
| ❖ **එක් කාමරයක් සඳහා ඇඳ ඇතිරිලි, කොට්ට උර සේදීමේ හා පිරිසිදු කිරීමේ ගාස්තු වශයෙන් රු.300.00 ක් ද අමතරව** අය කෙරෙන අතර, එම මුදල් **සංචාරක බංගලා භාරකරු** වෙත ලබා දීම සිදු කළ යුතුය | ❖ **එක් කාමරයක් සඳහා ඇඳ ඇතිරිලි, කොට්ට උර සේදීමේ හා පිරිසිදු කිරීමේ ගාස්තු වශයෙන් රු.300.00 ක් ද අමතරව** අය කෙරෙන අතර, එම මුදල් **සංචාරක බංගලා භාරකරු** වෙත ලබා දීම සිදු කළ යුතුය |

**සැලකිය යුතුයි:-මෙම සංචාරක බංගලාවන් මහල් හතරකින් යුත් ගොඩනැගිල්ලක <u>සිව්වන මහළේ (04) පිහිටා ඇති බව</u> හා <u>මේ සඳහා විදුලි සෝපානයක් නොමැති</u> බවද කරුණාවෙන් සලකන්න.**

**<u>සංචාරක බංගලා භාරකරුගේ විස්තර</u>**
නම : **ජානක මල්වත්ත මහතා**
දුරකථන අංකය : 076-6930413

**නිවේදනය :-** අදාළ රෙදිපිළි ඉතා යහපත් හා පිරිසිදු මට්ටමෙන් ලබා දීමට බංගලා භාරකරු බැඳී සිටී. ඒවා භාවිතා කළ නොහැකි අපිරිසිදු මට්ටමින් පවතී නම් ඒ බව භාවිතා කිරීමට ප්‍රථම බංගලා භාරකරුට දැන්වීම හා යහපත් ඒවා ලබා ගැනීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.